## **2022/03/08 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව**

2022/03/08 දින පෙ.ව. 09.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 3. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 4. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 5. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 6. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 7. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 8. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 9. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 10. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 12. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 13. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 15. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 16. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 17. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 18. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 19. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 20. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 1. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 2. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 3. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2022.03.08 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. ගරු උප සභාපතිතුමා, චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා, චන්ද්‍රසිරි වනිගරත්න මන්ත්‍රීතුමා අද සභාවට පැමිණීමට නොහැකි බව දන්වා සිටියා. ඒ අනුව අද දින ඔවුන්ගේ නිවාඩු අනුමත කල යුතු වෙනවා. ඒ වගේම අපේ විජිත් සහබන්දු මහතාගේ බිරිඳගේ වියෝව සම්බන්ධයෙන් අප සභාවේ සියළුම දෙනා වෙනුවෙන් මම මේ අවස්ථාවේ ශෝකය පළ කර සිටිනවා.

ඒ වගේම අපේ උරුමයක් වන ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ නදුන්ගමුවේ හස්ති රාජයා අද අප අතරින් වෙන්වී ගොස් තියෙනවා. ඒක මේ අවස්ථාවේ සිහිපත් කල යුතුම දෙයක්. මේ අවස්ථාවේ හස්ති රාජයා වෙනුවෙන් ශෝකය පළ කර සිටිනවා.

ඒ වගේම අද දින සභාවට පැමිණි මන්ත්‍රී මණ්ඩලය ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා.

**(අ)01. 2022.02.08 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත.**

2022.02.08 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**නැත.**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් "හඬට ඉඩක්" ව්‍යාපෘති යටතේ, ඊ- සහා ජංගම දුරකථන යෙදවුම හඳුන්වා දීම සම්බන්ධයෙන් 2022.03.04 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. ධීවර, සත්ත්ව නිශ්පාදන ..... හා යටිතල පහසුකම් අමාත්‍යාංශය, දකුණු පළාත් සභාව විසින් 2022.03.04 දිනැතිව යොමු කරන ලද වීථි මත්ස්‍ය අලෙවිකරුවන් සඳහා ජංගම මත්ස්‍ය අලෙවිසැල් ලබා දීම යන මැයෙන් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන යෝජනා.**

01. මීට පෙර වැඩ බලන ලේකම් තනතුරෙහි නිරත වූ එම්.ඒ ඩිලානි චන්ද්‍රප්‍රභා මහත්මිය එම තනතුරෙන් ඉවත්වීම නිසා නව වැඩ බලන ලේකම් තනතුරෙහි වැඩ භාරගත් චන්දිමා සෙනවිරත්න මහත්මිය චෙක්පත් අත්සන් කිරීම සඳහා පළමු අත්සන්කරු ලෙසත්, පී.කේ.මධුෂානි වාසනා මෙනවිය දෙවන අත්සන්කරු ලෙසත් පත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. උඩුගම ඇප්තොප්වත්ත ඉඩමේ නොදිරන කසළ බැහැර කිරීම සඳහා ඉදිකර ඇති වල පස් දමා වැසීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. මාපලගම ළමා උද්‍යානයේ නාම පුවරුවක් සවි කිරීම සඳහා යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. අනියම් පදනම මත සභාවේ සේවය කරනු ලබන පහත නම් සඳහන් සේවකයින් නිරෝධායනය වීම සහ කොරෝනා ආසාධනය වීම නිසා නිරෝධායනය වූ කාල සීමාවට අදාළව 50% උපරිමයකට යටත්ව සභාව තීරණය කරන ලද මුදලක් ගෙවීමට ගරු ආණ්ඩුකාරතුමා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව එම සේවකයන්ට රාජකාරි පවරා ඇති දින ගණන අනුව වැටුපෙන් 50% උපරිමය පහත දක්වා ඇති අතර, ඔවුන්ට ගෙවිය යුතු මුදල තීරණය කරන ලෙස යෝජනා කරමි.

| | | |
|---|---|---|
| එන්.එම්.රජිත් මයා | (2021.08.28 – 2021.09.08)<br>(2021.09.09 – 2021.09.23) | රු. 10690.16 |
| යූ.ජී.ආසිරි අභය කුමාර මයා | (2021.11.23 – 2021.12.12) | රු. 6507.05 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය පෙ.ව.11.10 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.**

**05. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

අංක 01 සිට 32 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

**<u>2022.03.08 වන දින පවත්වනු ලබන මහ සභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව</u>**

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

| | | |
|---|---|---|
| i. | 2022 පෙබරවාරි මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත | -රු.81,000.00 |
| ii. | PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් | - රු. 550.00 |

**02. එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මිය,**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක sp/psc/07/01/08(76) හා 2021.05.17 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම - 2022 පෙබරවාරි 01 සිට 21 දක්වා - රු.7,796.25

**03. විගණකාධිපති, විගණන කාර්යාලය**

හිඟ විගණන ගාස්තු ගෙවීම -රු.10,000.00

**04. නීතීඥ හේමන්ත පී.ඩබ්ලිව් විතාරණ මයා, ලේන්බාන් වීදිය, කොටුව**

| | | |
|---|---|---|
| i. | P 14658 දරණ නඩුවට අදාළව 2022.02.10 දින නීතීඥ පෙනී සිටීමේ ගාස්තු | - රු. 8,000.00 |
| ii. | L 13814 නඩුවට අදාළව 2022.02.24 දින නීතීඥ පෙනී සිටීමේ ගාස්තු | - රු. 3,500.00 |

**05. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2022 ජනවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 598 ක් | -රු.72,358.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 258 ක් | -රු.31,218.00 |
| LL 7366 ජල බවුසරය ඩීසල් ලීටර් 100 ක් | -රු.12,100.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 173 ක් | -රු.20,933.00 |
| LL 7103 ටිපර් රථය සඳහා ඩීසල් ලීටර් 250 ක් | -රු.30,250.00 |
| RA 8570 ට්‍රැක්ටරය සඳහා ඩී එස් 40 ඔයිල් ලීටර් 03 ක් | -රු. 2,250.00 |
| RA 8570 ට්‍රැක්ටරය සඳහා ඩී එස් 90 ඔයිල් ලීටර් 04 ක් | -රු. 3,920.00 |
| LL 7103 ටිපර් රථය සඳහා හයිඩ්‍රොලික් ලීටර් 05 ක් | -රු. 3,500.00 |
| LL 7049 නෙළුව ප්‍රාදේශීය සභා ටිපර් රථය සඳහා ඩීසල් ලීටර් 50 ක් | -රු. 6,050.00 |
| ගබඩා කර තබා ගැනීම සඳහා පෙට්‍රල් ලීටර් 25 | -රු. 4,425.00 |
| 2T Oil ලීටර් 1 | -රු. 750.00 |
| මාසික සහා වාර්තා බෙදීම වෙනුවෙන් (පෙට්‍රල් ලීටර් 5) | -<u>රු. 885</u> |
| **එකතුව** | **<u>රු.188639.00</u>** |

**06. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා 2022 මාර්තු මස මාසික කුලීය ගෙවීම - රු.6,000.00

**07. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

| | |
|---|---|
| i. SPPF 7360 අංක දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත පියවීම | - රු. 27,460.00 |
| ii.SPLL 7650 කෘ කැබ් රථය සේවා කිරීමේ බිල්පත | - රු. 29,925.00 |

**08. නිව් විජය මෝටර්ස්, ඔරොප්පුවත්ත, ගාල්ල**

PF 7360කැබ් රථය සඳහා අලුතින් ටයර් 04 ක් මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත - රු.175,600.00

(43900 x 4)

**09.** **ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝවේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, නො.90, යූනියන්පෙදෙස, කොළඹ 02**
ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය ටෝනර් ලබාගැනීමේ බිල්පත (2022/02/17-748275995) - රු.34,344.00

**10.** **A.J.G. ස්ටේෂනරි, කලුවැල්ල, ගාල්ල**
ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාල සඳහා 2022 වර්ෂයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල්පත පියවීම -රු.19,557.75

**11.** **පී.එල්.රංජන් මයා, ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල**
ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය මුද්‍රා 03ක් සකස් කර ගැනීමේ බිල්පත - රු. 5,000.00

**12.** **එම්.එම්.මහින්ද මයා, භවන ෆර්නිචර්, පිටිගල පාර, මත්තක**
ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය කාර්යාල මේස 03 ක් සහ පුටු 04 ක්ලබා ගැනීමේ බිල්පත රු.106,600.00

**13. ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. 2022 පෙබරවාරි මස පැවති සභාවාරය සඳහා මහජන නියෝජිතයන් වෙනුවෙන් දුරකථන කාඩ්පත් ලබා දීමේ බිල්පත් පියවීම -රු.28,500.00
ii. 2022 ජනවාරි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 3,315.00

**14.ජී.පී.සඳුන් චතුරංග මයා, ර්බේස් කම්පියුටර් ටෙක්නොලොජී, මාපලගම**

i. පරිගණක යන්ත්‍ර සඳහා eset computer auto virus මෘදුකාංගය ලබා ගැනීමේ බිල්පත -රු.15,000.00 (04 X 3,750.00)
ii. පරිගණක යන්ත්‍ර සඳහා UPS මිළදී ගැනීමේ බිල්පත (4 X රු. 6,800.00) රු.27,200.00
iii. ප්‍රධාන කාර්යාලය පරිගණක සඳහා අවශ්‍ය වයිෆයි ඇඩප්ටර් 04 ක් මිළදී ගැනීමේ බිල්පත - රු.5,800.00
iv. ගා/නාප්‍රාස/ආ04/කොම් /09 පරිගණකය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු.4,100.00

**15. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**

i. ප්‍රාදේශීය සභාවේ 2022.02.08 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ වියදම් බිල්පත - රු.5,060.00

**16. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ**

i. 2022.02.28 දින පැවැත්වූ පුස්තකාල උපදේශන කමිටු සාමාජිකයින් සඳහා සංග්‍රහ වියදම් - රු. 523.80

**17. එම්.ජේ.ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**

i. ප්‍රාදේශීය සභාවේ 2022.02.08 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු.7,840.00

**18. ජී.එල්.ලක්මාලි , සාරංග ෆුඩ් සිටි, මාපලගම**
සෞඛ්‍ය කම්කරුවන් සඳහා අවශ්‍ය සබන් මිළදී ගැනීමේ බිල්පත් ගෙවීම
216 x රු. 67.00 රු.14,472.00

**19. දයානි පුද්ගලික සමාගම, මාපලගම**
උඩුගම සතිපොළෙහි ජල සම්බන්ධතාවය සවි කිරීමට අවශ්‍යය ද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල්පත ගෙවීම

(වතුර මීටරයේ සිට පුරනැගුම වැසිකිළි පද්ධතිය දක්වා) -රු.14,955.00

**20. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2022පෙබරවාරි - රු. 5,750.00

**21. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2022 පෙබරවාරි - රු. 6,550.00

**22. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2022 පෙබරවාරි) - රු.14500.00

**23. <u>ගමන් වියදම් (</u>ආයතන රාජකාරි සඳහා)**
**<u>2022 පෙබරවාරි මස</u>**

| | | |
|---|---|---|
| i.නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු.4,000.00 |
| ii.කේ. ඩී. එස්. නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරි | - රු.2,640.00 |
| iii.ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 520.00 |
| iv.කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | -රු.2,365.00 |
| v.එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | -රු.5,600.00 |
| vi.බී.ජී.පියතිලක මයා | - රියදුරු | -රු. 350.00 |
| vii.කේ.එච්.එම්.කැළුම් චාමර මයා | - රියදුරු | - රු. 350.00 |

**<u>24. අතිකාල දීමනා ගෙවීම</u>**
**<u>2022 ජනවාරි මස</u>**

| | | | |
|---|---|---|---|
| i. | එච්.ඩබ්.එස්.සන්ධ්‍යා මල්කාන්ති මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු.3,500.00 |

**<u>2022 පෙබරවාරි මස</u>**

| | | | |
|---|---|---|---|
| i. | ඒ.එස්.මසීදා මිය | - කළමනාකරණ සේවා නිලධාරී | - රු.3,897.60 |
| ii. | එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9,136.00 |
| iii. | බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු.1,027.00 |
| iv. | යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු.6,530.00 |
| v. | ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු.5,350.00 |
| vi. | චතුරානි පතිනායක මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු.2,842.00 |
| vii. | ඩබ්.ජී.දයානන්ද මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු.4,702.00 |
| viii. | ඒ.එච්.ජී. සංජීව මයා (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 8,556.00 |
| ix. | ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.6,099.00 |
| x. | කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 5,457.00 |
| xi. | කේ.එච්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - අනියම් රියදුරු | - රු.8,560.00 |
| xii. | එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 682.00 |
| xiii. | එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු.3,838.00 |
| xiv. | එම්.ඩබ්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු.1,502.00 |

xv. වී.ජී.හර්ෂ චාමර සම්පත් - සෞඛ්‍ය කම්කරු - රු. 2,525.00

**25.සේවක ණය**

දසමස් වැටුප් අත්තිකාරම් මුදල් ලබා ගැනීම්
චතුරානි පතිනායක මිය - වැඩ/ක්ෂේත්‍ර කම්කරු - රු.250,000.00

**පොදු අරමුදල්**

**26. පී.චානක රංග, චානක එන්ටර්ප්‍රයිසස්, කහඳූව**

යෝජිත වලකුඹුර ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීමට ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම (iv අදියර)
(පැය 30.4 x රු. 2500.00) - රු. 76,000.00

**27. ඒ. පී.කේ. ප්‍රදීප් මයා, ඒ. පී.කේ. කන්ට්‍රෝල් රොක් බ්ලාස්ටර්, ගාල්ල**

ආදාහනාගාර පිවිසුම් මාර්ගයේ ඇති කලුගල ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 50,400.00
(දික් අඩි ගණන 112 x දික් අඩියකට ගෙවන මුදල රු. 450.00)

**28. ටී.එච්.චාමර සම්පත් මයා, චාමර කන්ස්ට්‍රක්ෂන්, උක්ඕවිට, උඩුගම**

උක්ඕවිට පෙර පාසල් භූමියේ කාණු කැපීම හා පස් ඉවත් කර උප කාර්යාල භූමියේ වගා කිරීම සඳහා බිම් සැකසීම වෙනුවෙන් ගෙවීම ( පැය 32.6 x රු. 1300.00) - රු. 42,380.00

**29. ඩී.එල්.අසංක සදරුවන්, උක්ඕවිට, උඩුගම**

ඇප්තොප්වත්ත භූමියේ එළිපෙහෙලි කිරීම සඳහා මිනිස් ශ්‍රමය යොදා ගැනීම වෙනුවෙන් ගෙවීම (දින 20 x දිනකට රු. 1500.00) - රු. 30,000.00

**30. සී/ස බද්දේගම (බටහිර) ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, පුහුල්දූව, බද්දේගම**

කොතේගොඩකන්ද මාර්ගය සඳහා හියුම් පයිප්ප ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම- රු. 39,700.00

**රජයේ ආධාර**

**උපමාන පාදක ( මන්ත්‍රී ප්‍රතිපාදන )**

**ගරු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමා**

**31. එන්.ජී.දිල්ෂිත සුසන්ත මයා, ගමගේ එන්ටර්ප්‍රයිසස්, මාපලගම**

ගම්මැද්දේගොඩ රාහුල පෙර පාසල සඳහා ටීවී ස්ටෑන්ඩ් එකක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම
- රු. 7,000.00

**32. ඩී.ආර්. ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්, දම්රෝ, උඩුගම**

උඩුගම දකුණ උදාර පෙර පාසල සඳහා ළමා පුටු 15 ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම - රු. 9,855.00

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් අංක1 – 32 දක්වා ඉදිරි ගෙවීම් සභා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 2. රැස්වීම් රීති 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**01.** මාර්ග සංවර්ධනය සඳහා හියුම් පයිප්ප යොදා ගැනීමේදී පෙර ඇස්තමේන්තු කර ඇති මුදලට වඩා වර්තමානයේ හියුම් පයිප්ප මිළ වැඩි වී ඇත. එබැවින්, ඇස්තමේන්තුවල සඳහන් කර ඇති අවිනිශ්චිත පිරිවැය තුළින් එම වැඩිවූ මිළ ගණන් දැරීමටත්, ඒ අනුව නව මිළ ගණන්වලට හියුම් පයිප්ප ලබා ගැනීමටත්, සහා අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**02.** නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙසෙන ජනතාවට ප්‍රජා සත්කාරයක් කිරීමේ අරමුණ ඇතුව බෝ වන හා, බෝ නොවන රෝග සඳහා ආයුර්වේද වෛද්‍ය සායනයක් මාර්තු මස 23 වන දින අලුත්වත්ත විහාරස්ථානයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා රු. 15000.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානය නවීකරණය කිරීම කර්මාන්තයේ සිදු කරන ලද වැඩට අදාලව ලැබී ඇති රු. 437,918.79 ක බිල්පත ගෙවීම අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. නාගොඩ ප්‍රාදේශීය සභාව හා දෙරණ මාධ්‍ය ආයතනය එක්ව අවුරුදු උළෙලක් කිරීමට කටයුතු සංවිධානය කොට ඇත. ඒ සඳහා රුපියල් ලක්ෂයක් මුදලක් සභා අරමුදලින් වැය දැරීම සඳහා යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.** කේ.ඩී.එස්.නිපුනිකා මිය, සංවර්ධන නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් ඉල්ලුම් කර ඇති හා ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03-2019 ප්‍රකාරව අනුමත රුපියල් 6200.00 ක ක්ෂේත්‍ර දීමනාව ලබා දීම සඳහා සභා අනුමැතියට ඉදිරිපත් කල යුතු යැයි යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

06. නාකන්ද වත්ත මයියොක්කාහේන පාර සෝමලතා මහත්මියගේ නිවස දක්වා ජේ.සී.බී.යන්ත්‍රයක් යොදා පාර සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්ද්‍ු මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

07. තුන් හවුල් කැල්ල -මහ ගෙදරවත්ත නව පාලම දෙපස පස් දමා ගොඩ කිරීම සඳහා ආදාහනාගාර ඉඩමෙන් ඉවත් කරන පස් කියුබ් 20 ක් හා කොරිපස් කියුබ් 03 ක් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්ද්‍ු මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

08. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් නිරවුල්ව සභාව විසින් භුක්ති විදිනු ලබන ප්‍රජාශාලාව ඉඩමෙන් පර්චස් 20 ක ප්‍රමාණයක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘතිය යටතේ අලුත්වත්ත සුහද තේ ශක්ති සමිතියට ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ලබාදීමට සභාවේ එකඟත්වය ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**09. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

| | |
|---|---|
| 01. උඩුගම පොළ සංවර්ධනය කිරීම (නව මිළ ගණන් අනුව) | රු. 200,000.00 |
| 02. 214 බී කැටගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් සමෘද්ධි මාවත කොරිපස් යොදා සංවර්ධනය කිරීම | රු. 50,000.00 |
| 03. තල්ගස්වල සති පොළේ ඉදි කල ඇති අබලන්ව සහ භාවිතයට නොගන්නා කඩ කාමර කඩා ඉවත් කිරීම | රු. 65,000.00 |
| 04. ඇටඹගහවිල කෘෂි මාර්ගයේ දොලේ කඩේ පිවිසුම අසළ සපත්තු පාලම ඉදි කිරීම | රු. 200,000.00 |
| 05. 214 අලුත් ඉහළ ග්‍රාම නිලධාරී වසමට අයත් දෙහිගොඩ වෙලේගෙදර මාර්ගයේ අබලන්ව ඇති ස්ථානය සඳහා බෝක්කු යොදා සංවර්ධනය කිරීම | රු. 13,700.00 |
| 06. ඇප්තොප්වත්ත ඉඩමේ නොදිරණ කසල වල ජේ.සී.බී. යන්ත්‍රයක් ආධාරයෙන් පස් දමා වසා දැමීම | රු. 12,500.00 |
| 07. 214 ඊ කැටගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් ඇල්ලවත්ත මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | රු. 50,000.00 |
| 08. මාපලගම ඉදිකරන ලද ළමා ක්‍රීඩා පිටිය දෙපස සහා මාර්ගවලින් ඉවත් කරන කැටගල් අල්ලා මිදුල සැකසීම | රු. 40,000.00 |
| 09. කොතේගොඩකන්ද මාර්ගයේ ඒ.කේ. කමලාවතී මහත්මියගේ නිවස ඉදිරියෙන් ඇති කොන්ක්‍රීට් මාර්ගය හරහා සිළිංඩර් යොදා සංවර්ධනය කිරීම | රු. 100,000.00 |
| 10. තුන්හවුල්කැල්ල මහගෙදරවත්ත නව පාලම දෙපස පස් දමා ගොඩ කිරීම | රු. 25,000.00 |

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**10.මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නැත.**

**(ඊ) කාරක සභා වාර්තා**

01.2022.03.02 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව

02. 2022.02.28 දින පැවති පුස්තකාල උපදේශන කමිටු වාර්තාව

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2022 පෙබරවාරි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව 2022 මාර්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2022 පෙබරවාරි මාසයට අදාළ මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය 2022 මාර්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම මුලින්ම ප්‍රාර්ථනා කරනවා. ඔබතුමාලා යන චාරිකාව ඉතාම සාර්ථක චාරිකාවක් වෙන්න කියලා. ගරු සභාපතිතුමනි, පසුගිය දින මාගේ බිරිඳගේ වියෝව සිදුවුණා. එම අවස්ථාවේ දී ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඒ පිළිබඳව සොයා බලලා, ඉතා විශිෂ්ට ලෙස මට උපකාර කළා. පැමිණි, නොපැමිණි සියලු දෙනාට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වෙලාවේ මට ලබා දුන් ශක්තිය සම්බන්ධයෙන්. මොකද ඒ ඉතා ශෝකජනක දුක්බර අවස්ථාවේදී මම සහ මගේ දරුවන් පිළිබඳ සොයා බලලා, ඉතා විශිෂ්ට සේවාවක් සැපයුවා. නොපැමිණියා කියලා හිතන්න එපා. මම දන්නවා ඔබ හැමෝටම යම් යම් හේතු නිසා එන්න නොහැකි වෙන්න ඇති. ඇත්තටම මම මේ අවස්ථාවේදී මගේ පවුල වෙනුවෙන්, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මාත් එක්ක සිටි සියලුම දෙනාට ස්තුතිය පුද කරන්න කැමතියි. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී ඉනෝකා නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ගිය සභා වාරයේදී ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කියූ කතාවකට පිළිතුරක් දීම සඳහා මම නැගී සිටියේ. උඩවැලිවිටිය කැප්පිටියගොඩ යාකරන පාළම සම්බන්ධව ප්‍රියන්තා මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා. ඔබතුමියගේ කාලයේ ඒ දේ කරගන්න බැරි වුන එක ගැන කණගාටු වෙනවා කියලා. එතුමියට පිළිතුරක් දෙන්නෙ. මම මේ සභාවට ඇවිල්ලා, පළමු සභා වාරයේදී, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලිපියක් ලැබිලා තියෙනවා. ඒ පාලම නැවත සකස් කරල දෙන්න කියලා. වජිර ඇමතිතුමා විසින්2017.12.07 දින ලිපිය යොමු කරලා, ස්ථාන පරීක්ෂණයක් කරලා, වාර්තා කරලා, කරන්න පුළුවන් හැකියාව පිළිබඳව දන්වලා ලිපියක් එවන්න කියලා තිබුණා. නමුත් මෙම ආයතනයෙන් ඒ පිළිබඳව සොයා බලා, ලිපියක් නොයවපු එක තමයි සිද්ද වෙලා තිබුණේ. නැතිව මගේ නොහැකියාව නිසා නොවෙයි, කියන එක මම එතුමියට කියන්න කැමතියි. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

පසුගිය දිනවල පුස්තකාල කමිටුව පැවැත්වූවා. එහි පොඩි පොඩි ඉල්ලීම් කීපයක් පමණයි තිබුණේ. එම පුස්තකාලවලින් අපෙන් ලොකු දේවල් බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් ඔවුන් අප සමග කියා සිටියා. මාපලගම පුස්තකාලයට එන පාඨකයන්ට ඉඳගන්න පුටුවල තියෙන හිගතාවය සම්බන්ධව. එවැනි දෙයක් වත් අපට සපයන්න නොහැකි වීම සම්බන්ධව අපි කනගාටු වෙනවා. පුටු වියන්න

පුද්ගලයෙක් ඇවිත් තිබුණ කිව්වා. නමුත් එක් පුටුවකට රුපියල් හයසීයක මුදලක් පමණ වැය වන නිසා තමයි, ඒ කාර්යය අතපසු වෙලා තියෙන්නේ. නමුත් සභාපතිතුමනි, අද හැම දෙයකම මිල වැඩි වෙලා. එවැනි මුදලක් නැතිව මේ දේ කරන්න බැරි වෙයි. ගරු සභාපතිතුමනි, ඒ අවශ්‍යතාව ඉටු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම සේවකයින් යොදවලා එම ස්ථානය සති දෙකකට වතාවක්වත් පිරිසිදු කරල දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද අපිරිසිදු වාතාවරණයක් තිබෙන විට, පාඨකයන්ට ගිහිල්ලා ඔවුන්ගේ කටයුත්ත නිසියාකාරව කරගන්න නොහැකි වෙලා තියෙනවා. එබැවින් කම්කරුවන් යොදවලා, ඒ කාර්යය කරලා දෙන්න. ඒ වගේම වැසි දිනවලදී මාපලගම මහජන පුස්තකාලය තෙමෙනවා කිව්වා. ඒකත් පිළිසකර කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඉනෝකා මන්ත්‍රීතුමිය අදහසක් ඉදිරිපත් කළා. එතුමියගේ අදහසට මම කරුණු එක් කරනවා. ඒ කාලය තුළ විශාල පාලම් තොගයක් හදන්න ඒ රජයෙන් මුදල් අනුමත වුනා. ඒ අවස්ථාවේදී මේ පාලම පිලිබඳවත් අවධානය යොමු වෙන්න ඇති. නමුත් එම පාලම් හදා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙන, ප්‍රමුඛතා ලයිස්තුවෙ නම් ටික කෙරෙහි අවධානය යොමු කරමින් තමයි මේ පාලම් ටික හැදුවේ. නමුත් එතුමියට වත්, ඒ කාලය තුළදී ඒ දේ කරගන්න බැරි වුනා අවාසනාවකට වගේ, අපිත් මේ දිනවල ඒ කටයුත්ත සිද්ධ කරගෙන යමින් ඉන්නවා. ඉදිරියේදී ඒ කටයුත්ත සිදුකරන්න අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා. අපි එතුමියටත් ආරාධනා කරනවා අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා ඒ පිළිබඳව අවධානයෙන් ඉන්නවා. එම පාලම අත්‍යවශ්‍යම පාලමක් බැවින් බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුමයි කියලා තමයි මගේ අදහස. එහෙම නම් වැඩිදුර කතා කිරීමට මම අදහස් කරන්නේ නැහැ. ස්තුතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි, මාපලගම උප කාරයාලයේ ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදු කරගන්න බැරිද සභාපතිතුමනි, එවිට අපට නිරවුල්ව ඒ ප්‍රදේශය වෙන්කර ගන්න හැකි වේවි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

පසුගිය දිනවල දී එම උප කාර්යාලය පිටුපස වැටක් ගහනවා කියලා දුරකතන ඇමතුම් ආවා. එවිට තාක්ෂණ නිලධාරී මහත්වරුන් සමග ගිහිල්ලා අපි නිරීක්ෂණය කළා. අදාළ පුද්ගලයා එතැනට පැමිණියා. එයාලගේ ඉඩමේම තමයි වැට ගහන්නේ අයිති නැති දේවල් වලටත් නඩු කියනකොට, නිකරුණේ මුදල් නාස්ති වෙනවා. අපේ ගොඩගම මහත්මයා තමයි තෑගි ඔප්පුවකින් ඉඩම පරිත්‍යාග කරලා තියෙන්නෙ. පර්චස් තිහක ප්‍රමාණයක් දීලා, තවම මැනුම් කටයුතු කරලා නැහැ. ඒ සම්බන්ධව නඩුවකුත් තියෙනවා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන්ම සභාපතිතුමනි, පෙර පාසල ලබා ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව, ඔබතුමාට ස්තුති කරන්න ඕන. මෙම ස්ථානයෙන් නිලධාරියෙක් යවලා ගොඩනැගිල්ල හා තිබූ උපකරණ ටික ලබාගෙන නැවත පෙර පාසලටම ලබා දීම සම්බන්ධව මාගේ ගමේ ජනතාවගේ ගෞරවය ඔබතුමා ඇතුළු සභාවේ සියලුම නිලධාරීන්ටත් විශේෂයෙන්ම මේ

සම්බන්ධව සොයා බලා, සභාවට පවර ගන්න කියපු සියලු මන්ත්‍රීවරුන්ටත්, මාගේ ගෞරවය මේ වෙලාවේ පුද කරන ගමන්, ගරු සභාපතිතුමනි, ඉදිරි කටයුතු ටිකත් කරලා දෙන්න කියලා ඉල්ලනවා. මම අපේ විජිත් සහබන්දු මන්ත්‍රීතුමාගේ සමාව ඉල්ලනවා. ඇත්තටම මම ලෙඩ වෙලා හිටපු නිසා, ඒ අවමංගල්‍ය අවස්ථාවට සහභාගී වෙන්න ලැබුණේ නැහැ. ඊට සමාව අයදින ගමන් එතුමියටත් නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා**

ගරු සභාපතිතුමනි, අද වන විට ගිං ගඟ ආශ්‍රිත තොටුපළවල් අභිමිවීමේ තත්ත්වයක් උද්ගත වෙලා තියෙනවා. උනන්විටිය ප්‍රදේශයට තොටුපළවල් නමයක් විතර තියෙනවා. හොරෙයිතොට තොටුපලේ ඇල අයිනටම වැටක් ගහලා, එම ඉඩම එම තැනැත්තාට අයිතිය කියලා ඔහු අයිති කරගන්න හදනවා. කෙසේ වෙතත්, අපේ හිටපු සභාපතිතුමෙකු වන ඉලේපෙරුම මහත්මයා, ඒ තොටුපළ ඉදි කරලා තියෙන්නේ. මට මතක හැටියට අඩි දහයක් පහළොවත් අතර පාරක් තියෙනවා. ඒ පාරත් අහිමි වෙලා තියෙනවා. ඇල රක්ෂිතයේ කොහොමත් වැටක් ගහන්න බැහැ. හැකි තරම් ඉක්මනින් ඒ වැට ඉවත් කරන්න කියලා අපි ඉල්ලනවා. ඊට අමතරව අපේ ඓතිහාසික තොටුපළක් වන උඩවැලිවිටිය - උනන්විටිය යාකරණ ලියනගහවිට තොටුපළ, ඒකෙ තාම බැමි සහිතව තියෙනවා. අද සභාවට එනකොට මම දැක්කා, එතනත් සුද්ද කරලා, පස් ගොඩක් දාලා තියනවා. එතන ගොඩ කරලා, කඩයක් හදන්න කියලා තමයි ආරංචි. ඒ ගැන සොයා බලලා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. උනන්විටියෙ මංසන්දියෙ තියෙන තොටුපළෙත් වැටක් ගහන්න හැදුවා. ඒකත් අපි නැවැත්තුවා. අපේ ගිං ගඟේ තිබෙන අසිරිය ආරක්ෂා කරගන්න ඕන. 1991 වර්ෂයේදී මම ප්‍රාදේශිය සභාවට ආවෙ. ඒ වකවානුවේ අපි එම තොටුපලවල් ප්‍රතිසංස්කරණය කළා. මම යෝජනා කළා ගං කන්ඩි කඩා වැටීම වැලැක්වීමට, උණ ගස් සිටුවන්න කියලා. විජේපාල හෙට්ටිආරච්චි සභාපතිතුමා තමයි ඒ වකවානුව තුල සභාවේ සභාපතිධූරය දැරුවේ. කුඹුක් ඉන්දුවා. ඒවා දැන් ඇත්තේ නැහැ. දැන් ගං කඩාගෙන ගිහිල්ලා තියෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි, හඟරන්වල පෙර පාසල නැවත පටන් ගන්න කියන එක තමයි මම පළමු ඉල්ලීම වශයෙන් කරන්නේ. එය සිදු කරල දෙන්න. ඒ වගේම ඔබතුමාව දැනුවත් කලාද දන්නේ නැහැ. නාකියදෙනිය රබර් කර්මාන්තශාලාව තියෙන ස්ථානයේ ගොම ගෙනල්ලා, ගොඩගහලා කරන කර්මාන්තයක්. ඒ ගොම අපද්‍රව්‍ය පහුගිය දවසක ඇළට එකතු වුණා. මෙහෙම කොම්පෝස්ට් අංගනයක් කරන්න මධ්‍යම පරිසර අධිකාරියෙන්, ප්‍රාදේශීය සභාවෙන්, ඒ වගේම පොලිසියෙත් පරිසර අංශයක් තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුමැතිය සහ ඒ අවශ්‍ය නිර්ණායකයන් අවශ්‍යයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කළාම කිව්වේ, පොලිසියෙ පැමිණිල්ලක් දාන්න කියලා. මේ කියපු ගොම සතියක් තිස්සේ ඇළ මාර්ගවල පල්ලෙහාට ගලාගෙන ගියා. ඇළ මාර්ගය සම්පූර්ණ කළුපාටයි. විජිත් මන්ත්‍රීතුමාලගේ පැත්තට තමයි ඒ ඇළ ගලා බසින්නේ. නමුත් පොලිසියේ පැමිණිල්ලක් දැම්මම තමයි මම ඉල්ලීමක් කළා. මේ සම්බන්ධ පරිසර වාර්තාව ලබා දෙන්න කියලා. නමුත් සභාපතිතුමනි, කිසිම රාජ්‍ය ආයතනයකින් හෝ කිසිම අවසරයක් අරගෙන නැහැ. කුකුල් ෆාම් එකක් දැම්මත්, එහි අපද්‍රව්‍ය බැහැර කරන්නේ පරිසර නියමයන් යටතේ තමයි. නමුත් නුවරඑළියේ සිට ගොම ගෙනල්ලා කරන මෙම ව්‍යාපාරයට කොහෙන්වත් පරිසර බලපත්‍රයක් ලබාගෙන නැහැ. සභාපතිතුමා ගෙන් මම ඉල්ලා සිටිනවා මේ සම්බන්ධව සොයා බලන්න. වහාම නඩු පවරන්න. එහෙම නැත්නම් කටු පොල් කර්මාන්ත ශාලාවෙන් අපද්‍රව්‍ය බැහැර කරන එක සම්බන්ධයෙන් හැමදාම වත්තෙන් දෙන උත්තරය තමයි අනේ දන්නැතුව වුණේ කියන එක. මේ සම්බන්ධව සොයා බලලා, අපේ පරිසර නිලධාරියෙක් ඉන්නවා.

එක්කෝ පරිසර නියමයන් යටතේ මේ කර්මාන්තය කරන්න උපදෙස් දෙන්න. කාලයක් දීලා, නැත්නම් නඩු පැවරීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනි නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අද දින ලෝක කාන්තා දිනය. අරාලකන්ද පහුගිය දවස් වල රුපියල් 37,500 ක් වියදම් කරලා, පාර කැපුවා. අපි සභාවෙන් කළ යුතු දෙයක් ප්‍රදේශ වාසීන් එකතුවෙලා කළා. නමුත් දැන් අපට එම පාරට සිළිංඩර් දෙකක් අවශ්‍ය වෙලා තියෙනවා එය ලබාදෙන්න කියල ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සෞඛ්‍ය මධ්‍යස්ථානයට යන පාර සම්බන්ධයෙන් සම්පත් මහත්මයා බලන්නත් ගියා. දැන් වලවල් හැදිලා අබලන් වෙලා තියෙන්නෙ. කොරි පස් දාලා හරි එම වලවල් ටික වහල දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම චාරිකාව සාර්ථකව කරගැනීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනය කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම දැන් මාස තුනකට කලින් යෝජනාවක් ගෙනාවා. කපල්විල ප්‍රදේශයේ ජනතාව පාර කපලා, ඒ මිනිසුන් ලිඛිතව ලියුමක් දුන්නා. බෝක්කු කැලි හතරක් ඉල්ලීම් කරලා. ඒ පිළිබඳ කිසිදු අවධානයක් ඔබතුමන් යොමු කරලා නැහැ. ඒ නිසා ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒ වගේම කුඹුරුහේන කනිෂ්ඨ විද්‍යාලය පිළිබඳව තොරතුරක් තවම නැහැ. නැවත පසු විපරමක් නැහැ. අපේ මන්ත්‍රීවරුන් දෙපලක් ම කියා සිටියා වගේ, මමත් කිව්වා. කුඹුරුහේන කණිෂ්ඨ විද්‍යාලය වැසීම පිළිබඳව. ඒත් කිසිදු පසු විපරමක් නැහැ. ඒ වගේම සභාපතිතුමනි, දිසානායක මන්ත්‍රීතුමා හා ධනංජය මන්ත්‍රීතුමා කියා සිටියා. පරිසර විනාශය සම්බන්ධව. ඇත්තටම දැවැන්ත පරිසර විනාශයක් සිදුවෙනවා. ඇත්තටම ලී මඩුවක් කරනවා නම්, රුපියල් 7500.00 ක මුදලක් ගන්නවා. ප්‍රවාහන ගාස්තු 3500.00 ක් ගන්නවා. නමුත් හෝමදොළ පැත්තෙ පරිසර විනාශයත් සමග ව්‍යාපාරයක් කරගෙන යනවා ඔවුන්ට මොනවත් නීතිමය ක්‍රමවේදයක්වත් මුදල් අයකිරීමක්වත් නැහැ. ඕක තමයි ධනේශ්වර ක්‍රමය කියන්නේ. පොඩි මිනිහාගේ දේ තමයි ඇත්තටම බලන්නේ. ඇත්තටම අපි ලැජ්ජ වෙන්න ඕන. මෙච්චර මේ සභාවක ඉඳලා මොකක්ද අපි කරල තියෙන්නෙ කියලා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

ගරු මන්ත්‍රීතුමා අපි නෙවෙයි පරිසර බලපත්‍රය දෙන්නේ. අපි දෙන්නෙ වෙළඳ බලපත්‍රය.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

අපේ සහබන්දු මන්ත්‍රීතුමාගේ බිරිඳගේ වියෝව සම්බන්ධව ශෝකය ප්‍රකාශ කරමින්, ඒ වගේම අද දින ලෝක කාන්තා දිනය සමරන්නේ කොහොමද කියලා තමයි මට කනගාටුව තියෙන්නේ. අද කොළඹ හයිලෙවල් පාරේ තමයි කාන්තා දිනය සමරන්නේ. නමුත් ගෑස් නැහැ. තෙල් නැහැ. මොනවද දැන් තියෙන්නෙ. ගොයම් කපලා වෙලේ. පාගගන්න ඩීසල් නැහැ. ඇත්තටම දැන් ඔය රජ පුටුවලින් බැහැලා යන කාලය ඇවිල්ලා තියෙන්නෙ. හත වෙනකොට ලයිට් කපනවා. අහිංසක දරුවන්ට ඉගෙන ගන්න විදිහක් නැහැ. හැමදේම මිල ඉහළ ගිහිල්ලා. පැනඩෝල් පෙත්තක් පවා නැහැ. අපි ඔය රජය පත් කරල තියෙන්නෙ, ඕකට විසඳුම් ලබා ගන්න. කෝ ඒවල වගකීම. දරුවන්ට කන්න බොන්න දෙන්න බැරිව දෙමව්පියො මැරෙනවා. ඔන්න රටේ තත්වය. තල්ගස්වල තව පරිසර විනාශයක් සිද්ධ වෙනවා. සභාපතිතුමා, විශ්වවිද්‍යාලයෙන් ළමයි ඇවිත්, තල්ගස්වල පාරේ යන්තෝපකරණ මධ්‍යස්ථානය දක්වා මාර්ගයේ රුක් රෝපණ වැඩසටහනක් කළා. ඒ හිටවපු ගස් කපා ගෙන යනවා. ඒ සම්බන්ධව අවධානය

යොමු කරන්න. දේශපාලනය අමතක කර සියලු දෙනාම එකට එකතු වී, නව දේශපාලන මාවතකට යන්න සියලු දෙනාට ශක්තිය, ධෛර්යය ලැබේවායි පතමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සියළු දෙනාගෙන් අවසරයි. විජිත් සහබන්දු සහෝදරයා එපා කිව්වත්, මට හදවතට එකඟ වෙන්න බැහැ. අපි ලෙන්ගතු මිත්‍රයෝ ලෙස එම අවමංගල උත්සවයකට සහභාගි වීමට නොහැකි වීම සම්බන්ධව මම බෙහෙවින්ම කනගාටු වෙනවා. හදිසි රෝග තත්වයක් නිසා සහභාගී වීමට නොහැකි වුනා. එම මැතිතුමියට නිවන් සුව පතනවා.

ඇත්තටම සභාපතිතුමනි, හැමදාම උගුර ලේ රහ වෙනකම් මේ රටේ ප්‍රශ්න සම්බන්ධව කතා කරල යනවා. අපේ පාලකයෝ මේ වගේ කියලා දන්නවනම්, ජනතාව මේ වගේ ආණ්ඩුවක් හදන එකකුත් නැහැ. ඒක සිද්ධ වෙලා ඉවරයි. ගෝඨාභය මහත්තයා දිවුරුම් දෙන අවස්ථාවේ මම කිව්වා. මේ නම් සෞභාග්‍යයේ දැක්ම නෙවෙයි. අභාග්‍යයේ දැක්ම කියලා. අද ඒක වෙලා තියෙනවා. අරුණ පුවත්පතේ තිබුණා. පිටරටින් හාල් ගෙන්නුවාම, කෝටි 600 ක් ලාබයි කියලා. ස්වයංපෝෂිත ආර්ථිකයක් තිබූ රට. නමුත් දැන් පිටරටවලින් වස විස හාල් නොවෙයිද මේ ගෙන්වලා කවන්නෙ. එහෙනම් සතොස හරහා ඔය ලාභයත් මේ දුක් විඳින ජනතාවට ලබලා දෙන්න පුළුවන්නේ. සතොසෙන් කිලෝග්‍රෑම් තුනයි හාල් දෙන්නෙ. මම දැක්කා එක තාත්තා කෙනෙක් හාල් ගන්න ඇවිල්ලා, ඒ හාල් විතරක් ගන්න බැහැ. තව මොනවා හරි ගන්න කියනවා. නමුත් ඒ තාත්තා අතේ සල්ලි තිබුණේ හාල් ගන්න විතරයි. ඒ පුද්ගලයා හාල් ටිකක් නොගෙන යන්න ගියා. රටේ තත්ත්වය ඇත්තටම හරිම ඛේදජනකයි. සමහර විට ඒ තාත්තාගේ දරුවෝ කුසගින්නේ වෙන්න පුළුවන්. මේකයි රටේ තත්ත්වය. මේ ආණ්ඩුවවට කඬේ ගිහිපු මිනිස්සු විසින් පත් කරපු ආණ්ඩුවෙන්ම, මිනිස්සුන්ට ගහනවා. ඇමතිලා කියනවා ලාභ ලබන ආයතන කියලා. නමුත් මිනිස්සු සූරා කාලා ලාභ ලබනවා. ආණ්ඩුව ජනතාව ජීවත් කරන්න ඕන. නමුත් ජනතාවගෙන් ආණ්ඩුව ජීවත් වෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුණනම්, ජනතාව මේ තරම් අපහසුතාවයට පත් වෙන්නේ නැහැ. කන්න ටික හරි තියෙනවා මම දන්න තරමින් ඉතිහාසයේ කිසිම ආණ්ඩුවක් මේ වගේ වුනේ නැහැ. සිරිමාවෝ මැතිනියගේ කාලෙත් රට හදන්න ප්‍රතිපත්තියක් ගෙනාවා. නමුත් ඒ කාලයේදී වත් මේ වගේ ජනතාව අපහසුතාවයට පත් කළේ නැහැ. මේක ඇමරිකන් කාරයෝ පාලනය කරන ආණ්ඩුවක් තියෙන රටේ, පිටරැටියන් ගේ න්‍යාය පත්‍ර වලට, අපි දන්නවා අපේ රට යටත් කරන්න පිඹුරුපත් සකස් කරමින් යන වග.

ඒ වගේම අසල්වැසි රට වලින් සුළු සුළු ණය මුදල් අරගෙන ජනතාව සන්තෝෂ කරන ආණ්ඩුවක්. මේ මගින් තව තවත් අයහපත් තත්ත්වයක් උදා වෙන්නේ රටට

මේ වගේ රජයකට ඉදිරියට යන්න බැහැ. ඉදිරියේදී මෙහෙම ගියොත් රටට ඇති වන්නේ අති භයංකාර තත්ත්වයක්. මේ රට විනාශ මුඛයට ඇද දමලා තියෙන්නේ. ඒ වගේම දරුවන්ට උගන්වන්න විදිහක් නැහැ. මෙවැනි තත්ත්වයක් තුළ දරුවන්ගේ අනාගතය අවිනිශ්චිත තත්ත්වයකට පත්වෙලා තියෙන්නේ.

ඒ වගේම පරිසරය සම්බන්ධයෙන් කථා කරනවානම්, ඉතිහාසගත නොවුණු විදිහට පරිසර විනාශයක් වෙලා තියෙනවා. අපේ ප්‍රදේශයේ විශාල ලෙස ගස් කොළන් කපලා තමයි මිනිස්සු ජීවත් වෙන්නේ. මම මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අපේ කොට්ඨාස මන්ත්‍රීතුමා වන විලේගේ මන්ත්‍රිතුමා යම් සඳහනක් කලා. වතු සමාගමෙන් කෙරෙන පරිසර හානිය පිළිබඳව. මෙතනට පැමිණි පලවෙනි දවසේ සිට කතා කරපු කාරණා සම්බන්ධව තමයි, අපට කතා කරන්න සිදුවෙලා තියෙන්නේ. ඒ දේවල් වලට ඔබතුමාගේ බලතල පාවිච්චි කරලා, ඒ කටයුත්තත් නොකෙරෙන එක ගැන අපි

කණගාටු වෙනවා. විලේගේ මන්ත්‍රීතුමා, උප සභාපතිතුමා, අජිත් මන්ත්‍රීතුමා ඔය වතු සමාගමෙන් සිදු වන පරිසර හානිය පිළිබඳ, අද ඊයෙක නෙවෙයි කතා කළේ. සභාපතිතුමාට තිබෙන බලතල පාවිච්චි වෙනවා නම්, මේ දේවල් මේ ප්‍රදේශයේ සිදු වෙන්න බැහැ. මේ බල ප්‍රදේශයේ නීතිරීති අඩු නිසා, වතු සමාගම බලාපොරොත්තු වෙනවා. ලංකාව පුරා තියෙන අපද්‍රව්‍ය ටික මෙහෙට ගේනවා. මොකද ඔය අපද්‍රව්‍ය දික්ඔය, හැටන්, දිගන, ආදී ඒ ප්‍රදේශවල ඒ අපද්‍රව්‍ය බැහැර කරන්න දෙන්නෙ නැහැ. ඒ එක එක අංශවලින් විරෝධතාවය දක්වලා තියෙනවා. එයාලා බලන්නෙ නීතිරීති කොහෙන්ද ලිහිල්ම කියලා. නාකියාදෙණිය අවට හෝමදොළ අවට ඇති ලොරි රථ වලට රුපියල් තිස්හතලිස් දහසක් දෙනවා එක ලොරියකට ඒවගේ ලොරි දහයක් පහලවක් යොදවලා දේශපාලන හයියක් අරගෙන. ඒ දේවල් දෙන්නෙත්, ඒ අයට ගරු සභාපතිතුමනි. ඔබතුමාගේ බලය පාවිච්චි කරනවා නම්, ඒ සියලු දේ නැති කරගන්න පුළුවන්. මේ සභාවේ අපි කතා කරල ගියාට ඒ තත්ත්වයට අපි ඔබතුමාව ගෙනාවේ නැහැ. ඒක වෙනවනම් මෙහෙම වෙන්නේත් නැහැ. අපේ බල ප්‍රදේශයේ මොනවහරි ප්‍රශ්නයක් වුණා නම්, බලධාරියා ඔබතුමා. නමුත් විලේගේ මන්ත්‍රීතුමා ගිහින් පැමිණිලි ඉදිරිපත් කළේ ප්‍රාදේශීය ලේකම්ට. නමුත් බලතල සභාවට. ප්‍රාදේශීය ලේකම් එකේ වෙනත් නිලධාරියෙක් පස්සේ යන්න සිදුවෙලා තියෙනවා.වැරදි තැන් වලදි අපි වැරදියි කියන්න ඕන. සභාපතිතුමනි ඉදිරියේදී මෙවැනි සිදුවීම් සිද්ධ වෙන්න බැහැ. මේ කියන දේවල් මෙහෙන් අහලා, අනෙක් පැත්තෙන් පිට කරලා දාන්න එපා. ඒවා ක්‍රියාත්මක කරන්න බලන්න. සභාවේ කතා කරන සමහර කාරණා සම්බන්ධව ඔබතුමා උනන්දු වෙනවා නම්, ඊළඟ සම්බන්ධීකරන කමිටුවේදී ඉදිරිපත් කරන්න පුළුවන්. සම්බන්ධීකරණ කමිටුවේදී ඔබතුමාලා අපි මේ කතා කරන වැදගත් කාරණා කීයක් කතා කරනවද කියලා ප්‍රශ්නයක් තියෙනවා. මොකද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අපි අපේ ප්‍රශ්න කියන්න ඕනේ නැහැ. එහි බලධාරියා ප්‍රාදේශීය ලේකම්තුමා. එතුමා එන්න ඕන ඔබතුමාට ඒ ප්‍රශ්නය කියන්න. විලේගේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරණාව සම්බන්ධව මා සොයා බැලුවා. බවුසර් හරි ලොරි හරි දහයක් එනවනම්, ඒ ස්ථානවල වලවල් ලෑස්ති කරනවා. ලෑස්ති වුණේ නැති වුනාම එම වලවල් වල තියෙන අපද්‍රව්‍ය, වෙන වලකට පම්ප් කරනවා. කොහොමහරි ඒ අවස්ථාවේදී විදුලිය ගිහිල්ලා තිබුණ නිසා, පැය ගානකට පස්සෙ විදුලිය ආවම, උදේ වෙනකල් මෝටරය දුවලා ඊට පස්සේ වල පිරිලා, එම අපද්‍රව්‍ය උතුරලා, ඇළ දිගේ ගිහිල්ලා, ඇල දූෂණයට ලක් වෙලා. යටලමත්ත, බෙම්බඩ හරියට එනකොට තමයි දික්දොල හරියෙදි වීඩියෝ කරලා, FB දාලා තිබිලා දැක්කම තමයි මම කළමනාකාරතුමාගෙන් ඇහුවම කිව්වේ, මේ සිද්ධිය දන්නේ නැහැ. දැන් ඒ පැත්තට යන්න හදන්නේ කියලා. නමුත් එම වතු සමාගම්වල අය දැන් බයත් නැහැ. ප්‍රාදේශීය සභා මන්ත්‍රී, සභාපති කතා කලා කියලා, එයාලට ප්‍රශ්නයක් නැහැ. හැටන්, දික්දොළ පැත්ත ප්‍රදේශවල මේ අපද්‍රව්‍ය දාන්න දෙන්නෙ නැහැ. වලවල් සීල් කරලා. ඒ දෙමළ ජනතාව අපද්‍රව්‍ය දානවට විරුද්ධ වෙනවා. අපිට හානියක් නොවුනත්, අපට මෙය ආදායම් මාර්ගයක් කර ගත හැකි දේවල්. වතු සමාගම් වලට ඕන විදිහට තමයි දැන් නිලධාරීන් හසුරුවන්නේ. වහාම ඔබතුමා ක්‍රියාත්මක වෙන්න. කියුබ් එකකට ගානක් අය කරන්න. නිසි ප්‍රමිතියට කරන්න. එවිට ආදායම් මාර්ගයක් වෙයි. මේ සභාවේ මම දැකලා නැහැ කිසිදු ආදායම් මාර්ගයක් එන දේවල් සම්බන්ධව කතා කරනවා. මන්ත්‍රීවරු කියන්නේ පෙර පාසල් වලට දෙන්න අරකට දෙන්න මේකට දෙන්න කියලා. නමුත් අපට වෙනදා එන ආදායම් මාර්ගයක් උදාහණයක් විදියට පොළවල් වලින් ආදායම් මාර්ගයක් එන්නේ නැහැ. ඉස්සරහට විශාල ප්‍රශ්නයක් තියෙනවා. මේ සභාවේ පොදු අරමුදල බැලුවම දැන් ලක්ෂ දහනවයක් වගේ මුදලක් තියෙන්නෙ. ඔය ටික ඉක්මනින් ඉවර වෙලා යයි සභාපතිතුමනි, අපේ බල ප්‍රදේශයේ ස්වභාවික ස්ථාන කොපමණ තිබෙනවද ඔබතුමා ගිය සභාවකදී කිව්වා. මලාමුර ඇල්ල පහුගිය දිනවල දී වෙළඳ දැන්වීමක් රූගත කිරීමක් සිදු වුණා. නමුත් එතනින් මුදලක් අය කරගන්න බැරි වුණා කියලා. ගමේ හොටෙල් එකක වෙඩින් කපල් එකක් ෆොටෝ එකක් ගන්නත් යම්කිසි මුදලක් අයකරනවා. රුපියල් 7,500.00 ක් රු. 10000.00 ක් වගේ මුදලක් ගෙවනවා. අපට කොපමණ සම්පත් තිබුනත්, එය ආදායම් මාර්ගයක් බවට පත් කර ගන්නෙ නැහැ. සභාවෙන් ඔබතුමාලා එකතුවෙලා මේ දේවල් කරන්න යම් වැඩපිළිවෙළක් කරන්න.

ඒ වගේම උඩුගම හොර වංගුව බෝඩ් ගහපු ස්ථානයේ, බෝඩ් ගහලා බදු ගන්න පුළුවන්. මේවා කියන්න ඕන දේවල් නෙවෙයි. මේ බල ප්‍රදේශයට ආදායමක් විදියට හරවගන්න කියලා ඉල්ලා සිටිනවා.

අද ලෝක කාන්තා දිනය. නමුත් ඉතිහාසයේ අද තමයි කාන්තාවෝ මේ රජයට වැඩිපුරම දොස් කියන්නේ. මොකද ගෑස් නැහැ. අපේ සභාවේ වාහන පවා අද ඩීසල් නැතිව පෙළ ගස්වලා තියෙනවා. අපි කවුරුත් මේ සම්බන්ධව විහිළුවට කතා කලත්, සැබෑ ප්‍රශ්නයක් තියෙනවා.

ඒ වගේම පාසල් ආරම්භ කළා. පහුගිය කාලේ දහස් ගණනින් රෝගීන් හමුවුනු අවධියේ පාසල් පැවැත්තුවා. නැතිනම් කණ්ඩායම් දෙකකට හෝ පාසල් පැවැත්වූවා. නමුත් මේ සතියේ චක්‍රලේඛයක් ඇවිල්ල තියෙනවා. ළමයි 40 ට වැඩි නම් කොටස් තුනකට පවත්වන්න කියලා. ගාලු යන ළමයෙකුට මාසෙකට දවස් පහයි පාසල් යන්න වෙන්නේ. ඔහොම කරලා පුළුවන්ද පාසල් පවත්වන්න. ඔබතුමන්ලා ලොකු අයට මේවා කියන්න. අනාගතයට මොනවද කරන්නේ කියලා.

7 වෙනිදා හම්බන්තොට ලංවා සිමෙන්ති කම්හල ආරම්භ කළා. නාමල් කියනවා නමුත් 2019 කොග්ගල නිදහස් වෙළඳ කලාපෙ ග්ලවුස් ප්‍රැක්ට්‍රියක් විවෘත්ත කළා . ඊට පස්සේ හම්බන්තොට ලුනුලේවායට යද්දි විශාල විරෝධතාවයක් දැක්වූවා. නාමල් ලේවාය ගැන කතා කළ වීඩියෝ හඬ පට ඔබතුමාලා ගාව ඇති. ඒ වගේ කියපු අය, උත්සව වලට නම් දාගෙන උත්සව කරනවා. අද රටට සංවර්ධනයට යමක් කලා නම් කළේ පහුගිය රජය විතරයි. වැඩදායි ව්‍යාපෘති ආරම්භ කරන්න කියලා ඔබතුමාලාගෙන් ඉල්ලමින්, සහබන්දු මහතාගේ බිරිඳගේ අවමංගල්‍යය උත්සවයට සහභාගි වුණා. එතුමිය වෙනුවෙන් ශෝකය පළ කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

මම විශේෂ අවසරයක් ඉල්ලනවා ඛනිජ තෙල් ප්‍රශ්නය ගැන කතා කරන්න. ලෝක වෙළඳපළේ ඛනිජ තෙල් බැරල් එකක් ඩොලර් සීයකට ගිහිල්ලා තියෙන්නෙ. අපි තෙල් සංස්ථාව විදිහට බොර තෙල් ගේන්නන්නේ 130 ට. මේකත් එක්ක තෙල් බෙදා දීමේදී ඩීසල් ලීටරයක් රුපියල් 52.00 ක් පාඩුපිට, පෙට්‍රල් ලීටර් එකක් රුපියල් 19.00 පාඩුපිට, භූමිතෙල් ලීටරයක් රුපියල් 6.00 ක් පාඩුපිට, දැවිතෙල් රුපියල් 76.00 ක් පාඩුපිට. මේ තත්ත්වයත් එක්ක තෙල් බෙදාහැරීමේදී, තෙල් නැව් වලට මුදල් ගෙවීමේ අර්බුදයකට මුහුණ දීලා හිටියා. IOC තෙල් මිල වැඩි කිරීමත් සමඟ, සිපෙට්කෝ ෂෙඩ් වලින් ගහපු තෙල් ප්‍රමාණය වැඩි වුණා. IOC 30 40 කින් වැඩි වන විට සිපෙට්කෝ ෂෙඩ්වලින් ගහන තෙල් ප්‍රමාණය වැඩි වුණා. එවිට අපට ඉල්ලුමට සැපයුම කර ගන්න බැරිවුණා. ඒ වගේම හිටපු අමාත්‍යවරයා ප්‍රකාශයක් කළා. තෙල් හිඟයක් නැහැ. නමුත් තව දින තුනකට පමණයි තෙල් තියෙන්නෙ කියලා. අපේ මිනිස්සු තෙල් අවශ්‍ය ප්‍රමාණයට වඩා එක්රැස් කර ගත්තා. මේ සමතුලිතතාවය, අසමතුලිත වුණා. මේ වන විට නැව් හතරක් ඇවිල්ලා තියෙනවා. එයින් නැව් දෙකක තෙල් දාලා මුතුරාජවෙල විදුලි පර්යන්තය හරහා විදුලිය සැපයීමට යොමුකරනවා. තව දෙකක් තියෙනවා. මිල වැඩි වේවි කියලා හිතලා, තෙල් ස්ටොක් කරගෙන ඉන්නවා. ඉහත සඳහන් කළ හේතු නිසා තමයි තෙල් සම්බන්ධව ප්‍රායෝගික ගැටලුවක් මතු වෙලා තියෙන්නෙ. මේකටත් ආණ්ඩුව වගකියන්න ඕන. මේ කාරණාව පිළිබඳව ඔබතුමාලට පැහැදිලි කරන්න ඕන නිසා තමයි මම කතා කරේ. අවසාන වශයෙන් විජිත් සහබන්දු මන්ත්‍රීතුමාගේ බිරිද වියෝ වීමේ හේතුවෙන් අපගේ බලවත් කණගාටුව, ශෝකය ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා.බොහොම ස්තූතියි.

**ප.ව.1.30 ට පමණ වසන්ත කුමාරගේ මහතා සභා ගර්භයෙන් පිටත්ව යන ලදී.**

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. පළමුවෙන්ම අපේ විජිත් සහබන්දු මන්ත්‍රීතුමාගේ බිරිඳ පසුගියදා අභවප්‍රාප්ත වුණා. මගේ ගමේ මන්ත්‍රීවරයා, හිතවතා, මිත්‍රයා හැටියට අපට පුළුවන් ආකාරයෙන්, ඒ දරු දෙදෙනා වෙනුවෙනුත් පුළුවන් හැම අවස්ථාවකදිම පෙනී සිටිනවා කියලා සිහිපත් කරනවා. ඡන්දයේදී වෙනත් පක්ෂයක වුවත්, ඔහු හැම අවස්ථාවකදීම මා සමඟ සහයෝගයෙන් වැඩ කළ පුද්ගලයෙක් ලෙස සිහිපත් කරනවා. ඔහුගේ බිරිඳ වෙනුවෙන් අවංක සංවේගය ප්‍රකාශ කරනවා.

2019 මැයි මස සභා රැස්වීමේ වාර්තාව අරගෙන ඉඩ තියෙන හැම මන්ත්‍රීවරයෙකුටම කියනවා කියවන්න කියලා. මම කියන්නේ සමන් මන්ත්‍රීතුමා, ලක්රුවන් මන්ත්‍රීතුමා සහා වාර්තාව නැවතත් කියවන්න. එදා ඔබ මේ පැත්තෙ ඉන්න මන්ත්‍රීවරුන්ට පුදුමාකාර විදිහට චෝදනා කලා සද්ද නැතුව හිටියා. ඔබේ වේදනාව ද,රටේ වේදනාවද  දන්නෙ නැහැ. රනිල් වික්‍රමසිංහට දෙස් තියලා පටන් ගත්තෙ. වරදක් කළා නම්, එයා කරපු අපරාධ වලට දඬුවම් හම්බවෙයි. කාදිනල් හිමිපාණන් ඊයේ දිනයේ දී ප්‍රකාශයක් කළා. ඒකයි, එදා සභා වාර්තාවෙ ඔබ කතා කළ දේයි කියවලා, ඒ දෙක එකතු කරලා, සංකීර්ණ කතාව කියවලා, පක්ෂය වෙනුවෙන් ඔබ කඬේ යන එක හරිද කියලා බලන්න. මමත් පක්ෂය වෙනුවෙන් කඬේ යනවා. මම දන්නෙ නැහැ. මොකක්ද හරි, මොකක්ද වැරදි කියලා. අපි වෙලාවකට කතා වෙලා වාද වෙනවා. කනගාටුවෙනවා. ඔබ කඬේ යන පක්ෂය, කාදිනල් හිමි ගෙ කතාව ඇතුළේ ඒ දේ තිබුණා. රාජපක්ෂලා වෙනුවෙන් කඬේ ගියාම, අර ගම්මන්පිල,විමල් වැනි පුද්ගලයන්ට සිදුවුන දේ තමයි ඔබටත් සිදු වෙන්නේ. ලක්රුවන් මන්ත්‍රීතුමා පහුගිය දවසක කිව්වා විමල් නැත්නම් මේ පක්ෂයත්,රජයත් නැහැ කියලා. සභාපතිතුමත් එහෙම කියලා තියෙනවා.

ඒ වගේම සභාපතිතුමා කියනවා. වත්ත වෙනුවෙන් මට ගන්න ක්‍රියා මාර්ගයක් නැහැ කියලා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

නැහැ, මම කිව්වේ පරිසර බලපත්‍ර අපි දෙන්නේ නැහැ. ව්‍යාපාර බලපත්‍ර විතරයි. කියලා. පැමිණිල්ලක් ආවොත් බලනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ඔබතුමාට තියෙන බලතල ඔබතුමා දන්නේ නැහැ. ඔබතුමාට මම නැවත කියනවා. ප්‍රාදේශීය සභා පනත කියවන්න කියලා. වත්ත වෙනුවෙන් ඔබතුමාලා ක්‍රියාමාර්ග ගත්තත්, ඊට එරෙහිව වැවිලි කර්මාන්ත ඇමති වත්ත වෙනුවෙන් පෙනී සිටිනවා.

ඔබතුමාලා කොහොම කිව්වත්, වෙන දා මෙහෙ මිනිස්සු කොන්ත්‍රාත් කළේ. දැන් අක්මීමන, වලහන්දූව ප්‍රදේශයේ මිනිස්සු දාලා කරවනවා. බලහත්කාරයෙන් රමේෂ් පතිරණ මහතා කරන්නේ. එහෙම සියලු බලපෑම් කරලා, ඒ සියලු කොන්ත්‍රාත් ටික  අද දින අද දෙන්නෙ එයාගේ ඡන්දදායකයන්ට. ඔබතුමාලා ඒවට කතා කරන්නේ නැහැ. සද්ද නැතුව ඉන්නවා. අපේ මිනිස්සුන්ට  බැරිද?  පාරවල් කොන්ක්‍රීට් දාන්න පුළුවන් මිනිස්සු අපේ කොට්ඨාස වල ඉන්නේ. නමුත් වෙනත් ප්‍රදේශවලින් මිනිස්සු ඇවිල්ලා වැඩ කරනවා. ටෙන්ඩර් කරලත් නැහැ. ඇමතිවරු හිඟමනට වැටිලා.

**ගරු මන්ත්‍රී සමන් නාපේ විතානගේ මහතා**

2019 මැයි මස සභා රැස්වීමේ වාර්තාවේ සඳහන් වෙලා නැහැ. මම ඒ නිසා වාර්තාවේ සඳහන් නොවන කිසිම කාරණයක් පිළිගන්නෙ නැහැ. එදාම ගිහිල්ලා බැලුවා. වාර්තාගත වෙලාද කියලා. එහෙම දෙයක් වෙලා නැහැ.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ මම හිතන්නේ අපේ දිසානායක මන්ත්‍රීතුමා සඳහන් කළ විදියට, උනන්විටිය හා වැලිවිටිය පාලමකට මුල්ගලක් තිබ්බා. එක් අවස්ථාවකදී ලියනගහවිට තොටුපල, ප්‍රධාන තොටුපළක්. එහි අනවසර ඉදිකිරීමක් සිදුකර තිබෙනවා. ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකරලා, එය ඉතාම ඉක්මනින් නවත්වලා, ඊට අදාළ කටයුතු කරන්න කියලා අපි ඉල්ලීම් කරනවා.

ඒ වගේම අපේ හිටපු සභාපති චන්ද්‍ර සහබන්දු මැතිතුමා සම්බන්ධ කරපු උඩවැලිවිටිය බටහිර ජල යෝජනා ක්‍රමය දැනටත් ක්‍රියාත්මක වෙනවා. ඔබතුමා දැනටමත් ප්‍රතිසංස්කරණය කරන්න කිහිප අවස්ථාවකදීම අපට මුදල් ලබා දීලා, ඒ අවශ්‍ය කටයුතු සිදුකළා. ඒ වගේම දැන් ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ රුපියල් ලක්ෂයක් වෙන් කරලා, එකේ බට එලන්න සූදානම් කරල තියෙනවා. ඒ සඳහා ඔබතුමාගේ අවසරයක් අවශ්‍ය වෙලා තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, ජල යෝජනා ක්‍රමයට බට ලබාදීම සඳහා ලිඛිත ඉල්ලීමක් ඒ සම්බන්ධයෙන් ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. ඒකත් මේ වෙලාවේ සිහිපත් කරමින්, මම හිතන්නේ සභාවෙ වැඩ කටයුතු කෙරීගෙන යන අවස්ථාවේ දී, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට ඇවිල්ලා, අපේ රටේ ජනතාවට කොරෝනා ලෙඩ බෝ කරලා වගේ, ඒ සියලු දේවල් එතුමන්ගෙ කර පිට පටවලා, ඒ වගේම පහුගිය ආණ්ඩු ඉතාම උජාරුවෙන් රටට සේවාවක් කරපු ආණ්ඩු හැටියට, වනමල් මන්ත්‍රීතුමා විශේෂයෙන් චෝදනා කළා. එතුමා චෝදනා කරලා සභාවෙන් බැහැරව ගිහිල්ලා තියෙනවා. කොහොම වුණත් මම කවදාවත් කිසිම දේශපාලන නායකයකුට හෙන, අවලාද ඉල්ලන්නේ නැහැ. ඕනම කතාවක් අරගෙන බලන්න. යම් කරුණු සාධක ඇතිව කතා කරලා තියෙන්නේ. එහි අර්ථවත් භාවය සහා වාර්තාව කියවනකොට තේරෙනවා. ඒ නිසා මම කවදාවත්ම ඇත්ත ඇති සැටියෙන්ම කතා කරපු කෙනෙක් ලෙස, 1977 මෙරටට විවෘත ආර්ථිකය හඳුන්වා දුන් කණ්ඩායම, හඳුන්වා දුන්නේ, අපේ රටේ තියෙන සියලු සම්පත් එදා තමයි විජාතීය බලවේගයන්ට යටත් කරලා, මේ රට මේ තත්වයට පත් කරන්නට හේතු වුණේ.

ඒ නිසා මේ රටේ අර ණය මුදල්, ආධාර මුදල් නියමිත ක්‍රමවේදයකට, සංචිතයකට අරගෙන පිළිවෙලක් කරලා තිබුනා නම්, මේ දේ අපට සිද්ධ වෙන්නේ නැහැ. අපේ රටේ මේ පාලන තන්ත්‍රයක් යන අවස්ථාවකදී වුවත් අනිවාර්යෙන් සිහිපත් කළ යුතු දෙයක් තියෙනවා. අපි හැමදාමත් මුඛ ආවරණ පැළඳ ගෙන තමයි පාරේ ගමන් කරන්නේ. මොකද වසර එකහමාරක කාලයක් අපි රට වහල තිබුණා. එහිදී විශාල පිරිසක් නිරෝධායනයට ලක්වුනා. එම ජනතාව සඳහා රුපියල් දහදාහක බඩු මල්ලක් ලබා දෙන්න ආණ්ඩුව කටයුතු කරල තියෙනවා. ඒ වගේම ජීවත්වීම සඳහා රුපියල් පන්දාහ වශයෙන් හා රුපියල් 2000 වශයෙන් රජයට මිනිස්සු ජීවත් කරන්න මිනිස්සුන්ට මුදල් ගෙවන්න සිද්ධ වුණා. කවර කවදාවත් ආණ්ඩුවකට මෙවැනි සිද්ධියකට මුහුණ දෙන්න සිද්ධ වුණේ නැහැ. විපක්ෂයෙන් කතා කරපු මන්ත්‍රීවරුන් කියා සිටියා. කවම කවරදාකවත් මෙවැනි ආණ්ඩුවක් දැක්කේ නැහැ කියලා. නමුත්, අපි ඒක පිළිගන්නවා. සියලුදෙනාම පිළිගන්න ඕන, අපේ රටට විදේශාධාර ලැබීම් සහ සංචාරකයින්ගේ පැමිණීම ඇණහිටලා. සියලු දේවල් නැති හංගස්ථාන වෙච්ච අවස්ථාවක තමයි, මේ රට කරන්නේ. මොන කණ්ඩායම ආවත් මේක ගොඩගන්න බැහැ. මොකද පසුගිය ආණ්ඩුව හොඳ සංචිතයක්, හොඳ වැඩපිළිවෙළක් හදලා තිබුණා නම්, අද අපට මෙහෙම වෙන්නේ නැහැ. ගමේ ගොඩේ ගත්තත්, බලන්න. දෙමව්පියෝ හම්බ කරල ඉතිරි කරපු මිනිස්සුන්ගේ දරුවෝ යහතින් ජීවත් වෙනවා. නමුත් දෙමව්පියන් නාස්ති කරලා, දරුවන්ට කිසිම දෙයක් ඉතුරු කර ගත්තෙ නැති කණ්ඩායම ඒ දරුවනුත් අදත් දුක්ඛිත තත්වයකට පත්වෙලා තියෙනවා. කවුරු කතා කළත්, මේ සියලු දෙනාම රෙදි ඇඳගෙනද කතා කරන්නෙ කියලා ප්‍රශ්නයක් තියෙනවා. මොන ප්‍රශ්න තිබුණත්, මේ රටේ එන්නත් ටික ගහලා මේ රටේ මිනිස්සු ජීවත් කරවලා තියෙනවා. කයිය ගහන කවුරුවත් එදා සභාවකවත් පාරෙවත් දකින්න හිටියේ නැහැ. සභාවේ මන්ත්‍රීවරු ටික ගැන නෙවෙයි මේ කතා කරන්නේ. රටේ ජනතාව රැක ගන්න ගෝඨාභය මහත්මයා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරල එතුමන් එන්නත්කරණය කළා. එක දෙක තුන මාත්‍රා වශයෙන් බූස්ටර් මාත්‍රාවත් ලබා දුන්නා. අද රටේ සියලු මිනිස්සු ජීවත් කරවලා තියෙනවා. ගෑස්, පෙට්‍රල් ආදී සියලු පෝලිම් වල ඉන්න මිනිස්සුන්ට ජීවත් වෙන්න අවකාශ ලබා දීලා තියෙනවා.

මේක බලාපොරොත්තු වෙන්න ඕන. මේක ලෝකයටම බලපාන ප්‍රශ්නයක්. කවුරු කළත් ප්‍රතිපත්තිමය වැඩසටහනක් නැතිව පහුගිය ආණ්ඩු ණයට ගත් මුදල් කවුරු ආණ්ඩු කලත් වාරික වශයෙන් ගෙවන්න ඕන. නැවත වතාවක් IMF එකට ගිහිල්ලා, ණය ගොඩගහ ගත්තොත් අපේ රටේ ණය බර තව වැඩි වෙනවා. එයත් ගැටලුවක්. රට ගොඩනගන්න නම් සියලු දෙනා කැප කිරීම් කරන්න ඕන. අඩුරු රෝගී තත්ත්වය නිසා යම් විදිහකින් රට හරිගියොත්, සුබවාදී වෙන්න පුළුවන්. සමහරු කතා කරන්නෙ මැරිල ඉපදිච්ච විදිහට. අපි මොනවා කතා කළත් යම් සේවාවක් සිද්ධ කරලා තියෙන්නේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා  යුද්ධයෙන් රට ගලවගෙන, තිරසාර ආර්ථිකයක් කරා රට නංවමින්, කරන්න පුළුවන් කාලය තුළදී යමක් කලා.

ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයාට මතක් කරන්න ඕන.  පහුගිය වකවානුවේදී කුඹුරකට බහින්න දුන්නෙ නැහැ. නමුත් ඔබතුමා අස්වැන්න  කොහොමද කියලා ගිහිල්ලා  බලන්න. තේ වල  ප්‍රශ්නයක් තියෙනවා. නමුත් කුඹුරු වල අස්වැන්න වැඩි වෙලා තියෙනවා.  ගඟකට, මුහුදකට බැහැලා බලන්න ඕන. ගැඹුර කොහොමද කියලා. තිරසාර ප්‍රතිපත්තියක් හදන තුරු, මේ රට ගොඩගන්න බැහැ. කොවිඩ් තියෙද්දිත් ගොවියෝ සහ ගුරුවරු ටික අරගෙන පාරට බැස්සා. නමුත් අභියෝග රාශියක් මැද තමයි මේ කටයුතු කරගෙන යන්නේ. එනිසා මේක ලේසි නැහැ. ඒ වගේම කාබනික වගාවට අපි පුරුදු වුනොතින්, එය නරකක් වෙන එකක් නැහැ. රටේ මිනිස්සු හෙන ඉල්ලුවත්, මහින්ද මහත්තයවත්, ගෝඨාභය මහත්තයාවත්  මිනිස්සු දුක්ඛිත තත්ත්වයට පත් කරන්න උත්සාහ කරන්නේ නැහැ. නමුත් මේ අර්බුදය හමුවේ, මෙම තත්ත්වය සමථයකට පත් කරලා, ඊළඟ සැරෙත් අපි ජයග්‍රහණය කරනවා කියන අදහසින්, මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමනි, අවසරයි. මම කතා කරන්න නෙවෙයි හිටියේ. ලක්රුවන් මන්ත්‍රීතුමාගේ කතාවත් ඇහුවම කතා කරන්න ඕනේ කියලා හිතුනා. මොකද අපේ ජාතික ආණ්ඩුව තියෙන කාලෙ, පොඩි පොඩි ප්‍රශ්න කිහිපයක් ඇති වුණා. මොකද පහළොස්දෙනා නැගිටලා, ආණ්ඩුවට යම් යම් දේවල් කිව්වා. ජාතික ආණ්ඩුව කාලේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගෙ නම කියමින්, එක්සත් ජාතික පක්ෂ නම කියමින්, අපට දෝෂාරෝපණය කළ හැටි අපිට මතකයි. අපි කතාකරන හැමදේම වාර්තාවෙ සඳහන් වෙන්නේ නැහැ. ඒ වගේම උදේ පාන්දර ටීවී එක දැම්මම වනිතා කටයුතු ඇමතිතුමා, ලෝක කාන්තා දිනය කියලා පටන් ගත්තා. නමුත් අද කාන්තාව කොතරම් අසරණ වෙලා ද. ලක්රුවන් මන්ත්‍රීතුමාට, මං දන්නැහැ දැනෙන්නේ නැද්ද කියලා. අපට හෙට වන විට යන්න වෙන්නෙ මොන පෝලිමට ද දන්නෙ නැහැ. මේ සභාවේ කාන්තාවන් හත්දෙනෙක් ඉන්නවා. අද දිනට අවුරුදු හතරක් වෙනවා. නමුත් කාන්තාවන් ලෙස අපට කිසිම දෙයක් කරගන්න බැරිවෙලා තියෙනවා. සභාපතිතුමා අද වෙනකොට මේ විදුලි කප්පාදුව ගැන කතා කරනවා නම්, මම පාන්දර  තුනට නැගිට්ටා. නමුත් හතර වෙනකොට විදුලිය කැපුවා. ඒ වගේ තත්වයක් තමයි රටට වෙලා තියෙන්නේ. වැඩිපුරම රට පාලනය කළේ රාජපක්ෂවරු. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, පොදුජන පෙරමුණ වැඩිම කාලයක් රට පාලනය කරලා තියෙන්නෙ.  ඉතින් කවුද මේවට වග කියන්න ඕන.  ණය ආධාර අරගෙන දේවල් ඉදිකරලා, කවුද රට වැඩිපුර ණය කරලා තියෙන්නේ කියලා ඔබතුමාලා හිතලා බලන්න. අද කාන්තාව මේ විදුලිය කප්පාදු ව හමුවේ අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා තියෙනවා. ඔබතුමාලා ජාතික රූපවාහිනිය නෙවෙයි හිරු සහ දෙරණ නාලිකාවත් නරඹන්න කියලා ඉල්ලමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී එන්.වී. පතිනායක මහතා**

ගරු සභාපතිතුමනි, මම යෝජනාවක් ඉදිරිපත් කළා. ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඌරල කොතේගොඩකන්ද පර්චස් 60 ක භූමි ප්‍රමාණයක් ඉතිරිවෙලා තියෙනවා. කාටවත් දීලා නැහැ. ඒ භූමි ප්‍රමාණය ප්‍රාදේශීය සභාවට පොදු කටයුතු සඳහා පවරා ගන්නා ලෙස ඉදිරිපත් කල  යෝජනාවට පසුගිය

සම්බන්ධීකරන කමිටුවේදී අනුමැතිය ලබා දුන්නා. ඒ ඉඩම පවරා ගෙන, මායිම් සලකුණු කර ගන්න, ඉදිරි කටයුතු ඔබතුමා විසින් ද සිදුකරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද අපේ ඌරල ප්‍රදේශයට කිසිදු පොදු ස්ථානයක් නැහැ. ඒ නිසයි මම මේ යෝජනාව කළේ. අපට ප්‍රජා ශාලාවක් ඉදි කර ගැනීමට අදහසක් තිබෙන නිසා, ඔබතුමා මැදිහත් වෙලා එම කටයුත්ත ඉතා ඉක්මනින් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ පොදු ළිඳ වටේට කෙසෙල් පැල 4 ක් හිටවලා තියෙනවා. එයින් දෙකක් කවුරුන් හෝ ගලවලා විසි කරලා තිබුණා. ඔබතුමා සමග ඒ සම්බන්ධව ඊයෙත් සාකච්ඡාවක් කළා. ඒ ගැනත් දැඩි අවධානයක් යොමුකරලා, කෙසේ හෝ ඔබතුමාගේ කාලය අවසාන වීමට කලින්, ළිඳ හාරලා හරි දෙන්න කියන ඉල්ලීම ඔබතුමාගෙන් කරනවා. විශේෂයෙන් මේ ඉඩම සම්බන්ධයෙන් මැදිහත් වෙලා, මායිම් සලකුණු කරගන්න මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු මන්ත්‍රීවරුන් ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. අද බොහෝ කරුණු කාරණා අපේ මන්ත්‍රීතුමන්ලාගෙ අදහස් වලින් ප්‍රකාශ වුණා. මේ සභාවේ ඉන්න සියලු මන්ත්‍රීවරුන් දැන උගත් කණ්ඩායමක්. අපි හැමදාම මේ සභාවෙ එකම දේමයි කතා කළේ. හෝද හෝද මංඩේ දානවා. අපි කවුරුත් දන්නවා වර්තමානයේ රටේ ඇතිවී ඇති තත්ත්වය. සියල්ල ගැන දැනගෙන තමයි අපේ මන්ත්‍රීවරු කතා කරන්නේ. මට මතක් වෙනවා. අද කාන්තා දිනයේ, කාන්තා අයිතිවාසිකම් ඉල්ලන කාලේ, මම හිතන්නේ නැහැ. ලංකාවෙ තරම් කාන්තාවට නිදහස දීපු කිසිදු රටක් නැහැ. ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමිය, ලංකාවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය. ඒ වගේම වර්තමානයේ ඉන්න එක්සත් ජාතීන්ගේ තරුණ සංවිධානයේ ලේකම්තුමිය ජයත්මා වික්‍රමනායක. ඒ වගේම ඕස්ට්‍රේලියාවෙ ජීවත් වන, ලංකාවේ කාන්තාවක් තමයි, ලෝකයේ වැඩිම පඩි ගන්න කාන්තාව. මේ ලංකාවේ කාන්තාවන්ට ලෝකෙ ලොකු තැනක් තියෙනවා. ඒ වගේම තමයි, ලංකාවේ දේශපාලනයෙන් 25% ක අයිතියක් ලබා දීලා තියෙනවා. මේ අනුව කාන්තාවට සම තැන කෙසේවෙතත්, නිසි තැන ලබා දීලා තියෙනවා. ඒ වගේම කුමන ආයතනයකට ගියත් කාන්තාවන් තමයි වැඩිපුරම රාජකාරියේ නියුක්තව ඉන්නේ. කාන්තාවන්ගෙ තැන කෙලෙසිලා නැහැ. කාන්තාවන්ට එය ලැබිලා තියෙනවා. ඒකට අපි ගරු කරනවා. මොකද අපිත් මේ ලෝකෙට බිහි කරන්නේ කාන්තාවක් නිසා. අම්මට අපි ආදරය කරන නිසා, ගරු කරන නිසා, කාන්තාවන් කාටත් එක සේ ගරු කරනවා. සමහර කාන්තාවන් ගරුත්වය කෙලෙස ගන්නවා. පෙරේදත් ටීවී එකේ දැක්කා. වට්ටි අම්මලා වගේ කෑ ගහන කාන්තාවො ඉන්නවා. ඒ කාන්තා අයිතිය අයුතු ලෙස භාවිතා කරන උදවිය. අපි කාන්තාව ගැන ලාංකිකයන් වශයෙන් සතුටු වෙනවා. 1970 වර්ෂයේදි සිරිමාවෝ මැතිණියගේ කාලේ රටේ යම් වෙනසක් කරන්න ඕන නිසා අනාගතය දැකලා, එතුමියත් යම් වැඩපිළිවෙළක් කලා. එතුමියන්ලා බලයට පත් වුණු කාලේ කතා වුනේ, කෙසෙල් බඩ කාලා, හබුරු කාලා ජීවත් වෙලා මැරුණයි කියලා කතා හදලා, එම පක්ෂය පරාද කරලා, සුබිතමුදිත රටක් හදන්න තමයි ඡන්දය දුන්නේ. 77 ආපු ක්‍රමවේදය තමයි මේ දිගටම තියෙන්නේ. දැන් කියනවා ගෑස් නැහැ. අවශ්‍ය දේවල් නැහැ කියලා. ඒ කාලේ අදට සාපේක්ෂව බැලුවොත්, ඒ කාලේ ගෑස් තිබුණෙ නැහැ. විදුලිය තිබුණේ නැහැ. පළාතේ කුඹුරු සියල්ල කළා. පෙට්‍රල් තිබුනෙ නැහැ. කුඹුරු කරලා හොඳට අටු කොටු පිරෙව්වා. වර්තමානයේ ඒක කරගන්න බැහැ. අදටත් හිතුවොත් අපිට ඒ දේ කරන්න පුළුවන්. රුසියාව, යුක්රේනය අතර යුද්ධයක් තියෙනවා. බලන්න මිනිස්සු මොනවද කරන්නේ කියලා. පෙලපාලි යන්නේ නැහැ. ඒත් මිනිස්සු ජීවත් වෙනවා. අපේ රටේ එහෙම දෙයක් වුනානම්, අනෙක් අය විරෝධය දක්වනවා. අපේ රට තමයි ලෝකෙ උතුම්ම රට. හොඳ උගතුන්, හොඳ බුද්ධිමත් මිනිස්සු සිටින ලංකාවේ එම මිනිස්සුන්ගෙ මොළවලින් ප්‍රයෝජනයට ගන්නේ නැහැ. වර්තමානයේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අර ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්ව වගේ, එතුමා බලය ගත්තේ 69 ලක්ෂයක් ඡන්දය දුන්නේ මොකද? අපි බලාපොරොත්තු වුණා හොඳට රට ඉදිරියට යයි කියලා. නමුත් පසුගිය කාල වකවානුවේ නොසිතූ වාතාවරණයත් සමඟ මෙතුමා තමයි නියම නායකත්වයට ගේන්න ඕනි කියලා කල්පනා කරලා, අපි ඡන්දය දුන්නේ. එතුමා

මාස හයක් හරියට ඒ කර්තව්‍ය කළා. යම් යම් නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා, නිලධාරීන්ට හරි දේ කරන්න කියන මතයට ආවා. අපි බලාපොරොත්තු වුණා ඒකාධිපති ස්වරූපය නැති වුවත්, යම් එවැනි නායකත්වයක්. නමුත් සියලු දෙනාගේ අභාග්‍යයට ලෝකයේ කොරෝනා වසංගතය ඇති වුණා. එම නිසා හැමදේම සැළසුම් කරපු විදිහට කරන්න බැරි වුණා. ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ, නොසිතූ නොපැතූ විදිහට, අපට සැළසුම් වෙනස් කරන්න වුණා. වියදම අධික වුණා. ඩොලර් බිලියන ගණන්, රුපියල් බිලියන ගණන්, අපට නොසිතූ දේවල් වලට වියදම් කරන්න සිදු වුනා. ඒ ගැන නිතර නිතර කියන්න අවශ්‍ය නැහැ. අපි කවුරුත් දන්නා දේවල්. එම නිසා තමයි අද මේ තත්ත්වයට හේතු වුණේ. ධනංජය මන්ත්‍රීතුමා කිව්ව වගේ, පන්සියයක තෙල් අවශ්‍ය පුද්ගලයෙක් රු. පන්දාහක තෙල් ගබඩා කර ගන්න විට කොහොමද මේ සමබරතාවය පවත්වාගෙන යන්නෙ.

ඒ වගේම අද වන විට සංචාරක ව්‍යාපාරය නතරවෙලා, තේ ව්‍යාපාරය කඩාවැටිලා. විදේශ ශ්‍රමික ආධාර අඩුවෙලා. මොකද මේවයින් තමයි වැඩිපුර ඩොලර් ආවෙ. ඔය ආකාරයෙන් තමයි රට දුවන්නෙ. කොයි කවුරු ආවත් රට ගෙනියන්න බැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුණනම්, මිනිස්සු පාරේ වැටි වැටී මැරෙනවා.

ගරු මන්ත්‍රීවරුනි, තව අවුරුදු දහයකට වත් මේ ආණ්ඩුව හොල්ලන්න බැහැ. මේ ආණ්ඩුව හොල්ලන්න හිතාගෙන ඇති ඔය පෝලිං තියෙනවා කියලා කෑමොර ගහන අය.

ඒ වගේම, විජිත් සහබන්දු මැතිතුමාගේ, ආදරණීය බිරිඳ පසුගියදා අභාවප්‍රාප්ත වූ බව දැනගත් වහාම, මම මන්ත්‍රීවරුන් සහ සභාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න කටයුතු කලා. අවසන් කටයුතු ගම්පහ වැනි දුරබැහැර ප්‍රදේශයක පැවති නිසා , පුළුවන් ආකාරයෙන් සම්බන්ධ වෙලා ඒ කටයුතුවලට සහභාගී වුණා, ඒ සම්බන්ධයෙන් මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සමස්ත සභාවේ හා අප බල ප්‍රදේශයෙහි ශෝකය මම මෙම අවස්ථාවේ දී පලකර සිටිනවා.

ඒ වගේම සමන් මන්ත්‍රීතුමා, හෝමදොළ ආරම්භ කරන්න යන පෙර පාසල සම්බන්ධයෙන් කතා කළා. පෙරපාසල පවත්වන ගොඩනැගිල්ල භාර ගැනීමේදී ,සභාවේ පවතින නීතිමය ක්‍රමවේදයන්ට අනුව අපි ඒ තක්සේරු වාර්තා අරගෙන, අදාළ නිලධාරීන් ලවා ඒ ඒ නීතිමය ක්‍රමවේදයට කරන්න ඕන. ඒක අපට හිතුමතේ කරන්න බැහැ. ඒ දේවල් අනාගතයේදී අදාළ නිලධාරීන් සිදු කරාවි. එම පෙර පාසල් පෞද්ගලික මට්ටමින් කරන ඒවා. නමුත් අපට කරන්න පුළුවන් වෙන්නෙ අධීක්ෂණය විතරයි. අපට මේ අවස්ථාවේ ඒ දේවල් කරන්න හැකියාවක් නැහැ.

තවද අද සභාවේ ප්‍රකාශ කල තොටුපළවල් පිළිබඳව ග්‍රාම නිලධාරීන් දැනුවත් කරලා, තාක්ෂණ නිලධාරි මහත්මයෙක් යවලා, පරික්ෂණයක් කිරීමට කටයුතු කලා. උනන්විටිය තොටුපල හා හොරෙයිතොට තොටුපල පිළිබඳව ඒකෙ ඇළ මාර්ගයට අඩි අටක් තියලා තමයි වැට ඉන්දල තියෙන්නෙ. නමුත් එහි වෙනසක අවශ්‍යතාවය ඇතිවුවොත් එය ඉදිරියෙදි පියවර ගනීවි. ඊ ලඟට අනිත් තොටුපලෙන් ප්‍රාදේශීය ලේකම්තුමා හා ග්‍රාම නිලධාරී දැනුවත් කිරීම් කරලා අවශ්‍ය කටයුතු සිදු කළා. ඒවගේම අපේ මන්ත්‍රීවරු සැලකිලිමත් වෙන්න විදුලිය පිළිබඳව අපේ වීදි ලාම්පු සමහර වෙලාවට මම නිවාගෙන යනවා අනවශ්‍ය විදුලි පහන් නිවාදමන්න මොකද අපට ඒ සම්බන්ධව චක්‍රලේඛ ලැබිලා තියෙනවා. නාකියාදෙණිය වත්තෙන් නිතර සිදු වන පරිසර හානි සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කරලා තියෙන්නෙ. එම ආයතන ඉදිරියේදී පියවර ගනීවි.

ගරු මන්ත්‍රීවරුනි, පසුගියදා එන්නත් කරන්න ගාල්ල කොටුව හමුදා කඳවුරෙන් ඇවිල්ලා අපෙන් අවශ්‍ය ආධාර ඉල්ලුවා. booster එන්නත, අප බල ප්‍රදේශයේ ජනතාවට ලබා දීම කිහිප තැනක සිදු කලා, ඒ අනුව අපේ සභාවට යම් කිසි වියදමක් දරන්න වුණා. ඒ සඳහා බිල් එකක් තවම ආවෙ නැහැ. විශේෂයෙන්ම මාපලගම උප කාර්යාල භූමිය මායිමේ වැට ගැසීමක් පිළිබඳව අපි දැනුවත් කළහම, ඒ පිළිබඳව සොයා බැලුවා. නීතිමය ගැටලු ඇති බැවින් ඒකට මැදිහත්වීමක් වුණේ නැහැ. නමුත් සභාව

සතු බිම් ප්‍රමාණයේ කටයුතු ඉදිරියේදී කරන්න බලාපොරොත්තු වෙමින්, විශේෂයෙන්ම කටයුතු සංවිධානය කර ගත් පරිදි මෙම මස 17 18 19 චාරිකාවක් යන්න යෝජනා කර ගත්තා ඒ කටයුතු සම්පාදනය කර තිබෙන ආකාරයට ඒ චාරිකාව යන්න සියලු දෙනාම එකතු වන්න යනුවෙන් ආරාධනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-